# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,325 - 2023 මාර්තු මස 24 වැනි සිකුරාදා - 2023.03.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... ... | — |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 86 |

*සැ. යු.* - දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2023 මාර්තු මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 අප්‍රේල් මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 මාර්තු මස 31 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

85- B 082439 — 353 (2023/03)
D 1 -

# විවිධ දැන්වීම්

## ''දහම් සෙවනේ සිඟිත්තෝ ළමා සංවර්ධන පදනම'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ගාමිණී ලොකුගේ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ ''දහම් සෙවනේ සිඟිත්තෝ ළමා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ, පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

01. පෙර පාසල් දරුවන්ගේ සිට විශ්වවිද්‍යාල දරුවන් දක්වා විවිධ භාෂාවන් ඇතුළත් අධ්‍යාපනයක් ලබාදීම ;

02. සියලු ආගම්වල දරුවන් හට ආගමික සංහිඳියාව ඇති කරමින් ආධ්‍යාත්මික කුසලතා සංවර්ධනය කිරීම ;

03. විශේෂ අවශ්‍යතාවයන් ඇති හා මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන් හඳුනාගෙන ඔවුන් හට නිසි පෝෂණ ක්‍රමවේදයක් සකසා දීම ;

යනාදිය වේ.

ගාමිණී ලොකුගේ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

03-572

---

## ''ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ඩබ්ලිව්. ඩී. වීරසිංහ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ ''ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ, පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය සංස්ථාගත කිරීමයි :-

(අ) පහසුකම් කළමනාකරණ වෘත්තියට අදාළව වෘත්තියේ යහපත, තත්ත්වය, ශුභසිද්ධිය, අයිතීන් සහ වරප්‍රසාද සහ මහජන අභිලාශ ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ආ) පහසුකම් කළමනාකරණය සහ ඊට සම්බන්ධිත විෂයයන් පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා දේශන සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ පොත් හා වෙනත් දේ පළකිරීම ;

(ඇ) ආයතනයේ සාමාජිකත්වය සඳහා අවශ්‍ය සුදුසුකම් හා නුසුදුසුකම් ද ආයතනයේ සාමාජිකත්වය සඳහා වන වෘත්තීය පැවැත්මේ ප්‍රමිති ද නියම කිරීම සහ ඒවාට අනුගතව ක්‍රියාකිරීම සහතික කිරීම ;

යනාදිය වේ.

ඩබ්ලිව්. ඩී. වීරසිංහ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
දිගාමඩුල්ල දිස්ත්‍රික්කය.

03-566

## ''මගේ සිහින යාපනය'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

සාරතී දුෂ්මන්ත වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ ''මගේ සිහින යාපනය'' පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ, පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

(අ) අධ්‍යාපනයේ සංවර්ධනයට ප්‍රමුඛතාවය දෙමින්, මහජනතාවට අවශ්‍ය සියලුම ආකාරයේ පහසුකම් සැලසීම ;

(ආ) කෘෂිකර්මාන්තය, ධීවර හා ජලජ සම්පත් ක්ෂේත්‍රවල පුනර්ජීවනය උදෙසා අතහිත දීම ; සහ

(ඇ) ශාරීරික හා මානසික වශයෙන් නිරෝගී සම්පන්න සමාජයක් ගොඩ නැංවීම උදෙසා නිර්මාණාත්මක පියවර ගැනීම ;

යනාදිය වේ.

සාරතී දුෂ්මන්ත,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

03-574

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.